# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 838/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 18/05/2024 පැය 1410

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. විදේශීය රටක නිෂ්පාදිත බලපත්‍ර නොමැති ගිනි අවියක් සමඟ සැකකරුවකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුර.**

2024.05.17 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කතරගම කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වීරවිල පොලිස් වසමේ ගෝනගමුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදුකර **විදේශී රටක නිෂ්පාදිත බලපත්‍ර නොමැති ගිනි අවියක් සමඟ සැකකරුවකු** අත්අඩංගුවට ගෙන වීරවිල පොලිස් ස්ථානයට ඉදිරිපත් කර ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 35 ක් වූ හම්බන්තොට ප්‍රදේශයේ** පදිංචිකරුවකු වේ. වීරවිල පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**02. ගංජා පැළ සමග සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුර.**

2024.05.17 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා උඩවලව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හම්බේගමුව පොලිස් වසමේ පළුපිටිකන්ද ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **ගංජා පැළ 13,752 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හම්බේගමුව පොලිස් ස්ථානයට භාරදී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු **වයස අවුරුදු 48 ක් වූ කොළඹගෙආර ප්‍රදේශයේ** පදිංචිකරුවෙකු වේ. හම්බෙගමුව පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**